සෙල්ලිපි මඟින් හෙළිවන සිංහල අක්ෂර මාලාවේ බින්දුව භාවිතය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

පි. නර්මදා තිලංකා කමලවීර

සිංහල අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය. thilankakamalaweera@gmail.com

ප්‍රමුඛ පදඃ බින්දු වර්ණය, අනුස්වාරය, අක්ෂර පරිණාමය, සෙල්ලිපි, මධ්‍යකාලීන භාෂා ලක්ෂණ

හැඳින්වීම

සිංහල වර්ණ මාලාවේ බින්දු වර්ණය සිංහලයේ භාවිතයට පැමිණි මුල් කාලයේ සිට ම විවිධ මතභේදයන්ට ලක් වූ වර්ණයකි. මෙම බින්දු වර්ණය සම්බන්ධයෙන් පැන නැඟී ඇති ගැටලු සිංහල අක්ෂර මාලාවේ අන් කිසිදු අක්ෂරයක් සම්බන්ධයෙන් හඳුනාගත නොහැකි තරම් ය. එය එසේ වුව ද අන්‍ය අක්ෂර අතර විශේෂ අක්ෂරයක් ලෙස බින්දු වර්ණය අපට හඳුනාගත හැකිය. සිංහලයේ බින්දු වර්ණය මුලින් ම අපට හමුවන්නේ සෙල්ලිපි මඟිනි. එහිදී බින්දු වර්ණය භාවිතයේ කිසියම් විශේෂත්වයක් හඳුනාගත හැකි ද? යන්න මෙම පර්යේෂණයේ ගැටලුවයි. එලෙසින් බින්දු වර්ණය භාවිතයේ විශේෂත්වයක් හඳුනාගත හැකි නම් ඒ කුමන අවස්ථාවල කුමන ආකාරයට ද යන්න අධ්‍යයනය කිරීම පර්යේෂණ අරමුණ වේ.

ක්‍රමවේදය

පූර්වෝක්ත අරමුණ ඉටුකර ගැනීමෙහිලා පුස්තකාල භාවිතය පර්යේෂණ ක්‍රමවේදය වූ අතර එහිදී භාරතීය සෙල්ලිපි සහ ලක්දිව සෙල්ලිපි මෙන්ම ඊට අමතරව පුස්කොළ පොත් ද මූලාශ්‍රය වී ඇත.

ප්‍රතිඵල හා සාකච්ඡාව

ලක්දිව ලේඛන කලාව ආරම්භ වන්නේ මිහිඳු හිමියන් මෙරටට රැගෙන ආ අශෝක බ්‍රාහ්මී අක්ෂර මාලාව මඟින් බව පිළිගත් මතයයි. මෙම අශෝක අක්ෂර මාලාව සහ සිංහල බ්‍රාහ්මී අක්ෂර මාලාව අතර කැපී පෙනෙන වෙනස්කම් ගණනාවක්ම හඳුනාගත හැකි වේ. ඒ අතර එක් ලක්ෂණයක් ලෙස අශෝක ලේඛන කලාවේ මුල් කාලයේ සිට ම භාවිත වූ බින්දු වර්ණය මුල් කාලීන සිංහල ලේඛන කලාවේ භාවිතයට නොපැමිණි ම හඳුනාගත හැකි වේ. ඒ අනුව සිංහල ලේඛන කලාව ආරම්භ වන්නේ ක්‍රි.පූ 3 වන සියවසේ මහින්දාගමනයෙන් පසුව වුවත් බින්දු වර්ණය සිංහල ලේඛන කලාවට පැමිණෙන්නේ ක්‍රිස්තුවර්ෂ 8 වන සියවසේ සිට බව මෙතෙක් ප්‍රකාශිත ලංකාවේ සෙල්ලිපි අධ්‍යයනය කිරීමේදී පැහැදිලි වේ.

සෙල්ලිපි අතර ප්‍රථමයෙන් ම බින්දු වර්ණය හමුවන්නේ ක්‍රිස්තුවර්ෂ 8 වන සියවසට අයත් ගැරඬිගල හා රාස්සහෙල යන ශිලාලිපිවලය. මෙම ලිපිවල 'සංබෝ' සහ 'වීරාංකුරම්' යන වචනවල අනුස්වාරය යෙදී ඇත ද එය යෙදූ ස්ථානය පැහැදිලි නැත. එහෙත් කුච්චවේලි හා තිරියාය යන සංස්කෘත සෙල්ලිපිවල බින්දු වර්ණය අක්ෂරය මුදුනේ ලියා ඇති අයුරු හඳුනාගත හැකිය. එය අනුස්වාරය අක්ෂරය මුදුනේ සංකේතවත් කර දක්වන පල්ලව ලිපිවල ආභාසය ලංකාවේ ලියවුණු ශිලාලිපි සඳහා ද බලපෑම හේතුවෙන් සිදුවී ඇත.

එහෙත් ඉඳිකටුසෑය ලිපියේ බින්දු වර්ණය අක්ෂරය මැද සහ මුදුනේ ලියා ඇති අයුරු පෙනේ.

ක්‍රිස්තුවර්ෂ 8-9 සියවසට අයත් සෙල්ලිපි අධ්‍යයනය කිරීමේදී මෙම සියවසේ වියවුල්පත සෙල්ලිපියේ අනුස්වාරය යෙදී ඇති අතර එය අක්ෂරය මුදුනේ සලකුණු කර ඇති බවක් හඳුනාගත හැකිය. එමෙන් ම ජේතවනාරාම රන්පත්වල ද අනුස්වාරය අක්ෂරය මුදුනේ සලකුණු කර ඇත. 10 වන සියවසට අයත් කිරිබත්වෙහෙර ලිපියේ 'සංබඩැ' යන තන්හි බින්දු වර්ණය වර්තමානයේ මෙන් අක්ෂරයේ දකුණු පස ලියා ඇත. මේ අනුව බින්දු වර්ණය වර්තමානයේ ලියා දක්වන ක්‍රමය සිංහල ලේඛන කලාවට ප්‍රවිශ්ඨ වී ඇත්තේ මෙම සියවසේදී බව පැහැදිලි වේ. අශෝක ලිපිවල ද ආන්ධ්‍රා සම්ප්‍රදායට අයත් කාර්ලේ හා අමරාවතී යන ලිපිවලද අනුස්වාරය සලකුණු කර ඇත්තේ අක්ෂරයේ දකුණු පස තිතක් යෙදීමෙනි.

ක්‍රිස්තුවර්ෂ 10-11 සියවසට අයත් මිහින්තලේ ශිලාලිපියේ බින්දුව භාවිත වී ඇති අතර එහෙත් එය සංකේතවත් කර ඇත්තේ බ්‍රාහ්මණ වේද ශාස්ත්‍රයන්හි අනුනාසිකය සංකේතවත් කරන චන්ද්‍ර බින්දුව යෙදීමෙන් වීම විශේෂත්වයකි. මෙම සියවසට ම අයත් අංක 1 දරන අනුරාධපුර වෙස්සගිරි ශිලාලිපියේ ද බින්දුව වෙනුවට දක්වා ඇත්තේ ද මෙම චන්ද්‍ර බින්දුවයි. එහෙත් අංක 2 දරන අනුරාධපුර වෙස්සගිරි ශිලාලිපියේ බින්දුව අක්ෂරය මුදුනේ සලකුණු කර ඇත.

ක්‍රිස්තුවර්ෂ 11-12 සියවසේ සෙල්ලිපිවල බින්දුව දැක්වීමේදී වර්තමාන අකාරයට අක්ෂරයේ දකුණු පසින් මෙන් ම තව ද අක්ෂරයට අකුණු පස ඉහළින් අක්ෂරයේ මුදුනට වන්නට බින්දුව යෙදූ අවස්ථා ද මෙම සියවසේදී බහුල ලෙස දැකගත හැකි බව මෙම සියවසට අයත් සෙල්ලිපි අධ්‍යයනයේදී පැහැදිලි වේ.

ක්‍රිස්තුවර්ෂ 12-13 මෙම සියවසට අයත් සෙල්ලිපි අතර බින්දුව යෙදී ඇති ලිපි අධ්‍යයනයේදී බින්දුව දැක්වීම පිළිබඳ ක්‍රම කිහිපයක්ම අනුගමනය කර ඇති බව පෙනේ. ඒ අනුව මෙකල බින්දුව යෙදීමේදී වර්තමානයේ මෙන් අක්ෂරය දකුණු පසින් බින්දුව දැක්වා ඇති අතර තව ද බහුල ලෙස අක්ෂරයට දකුණු පස ඉහළ කෙළවරේ ද බින්දුව සලකුණු කර ඇති බව පෙනේ. ඇතැම් අවස්ථාවන්හිදී අක්ෂරය මුදුනේ ද බින්දුව දක්වා ඇති ආකාරය හඳුනාගත හැකිය. ඉස්පිල්ල යෙදෙන අක්ෂරයකට පසුව බින්දුව යෙදෙන ඇතැම් අවස්ථා කිහිපයක පමණක් පිල්ලම සහ අක්ෂරය අතර බින්දුව ලියා ඇති ආකාරය දැක්වේ.

ක්‍රිස්තුවර්ෂ 13-14 සියවස්හි බින්දුව සලකුණු කළ ක්‍රම අතර වර්තමානයේ මෙන් අක්ෂරය දකුණු පසින් ද, තව ද අක්ෂරය දකුණු පස ඉහළ කෙළවරේ ද, අක්ෂරය මුදුනේ ද අනෙක් සියවස්වල මෙන් ම බින්දුව දක්වා ඇත. එමෙන් ම ඇතැම් විට අක්ෂර මධ්‍යයේ ද බින්දුව සංකේතවත් කර ඇති ආකාරයක් මේ යුගයේදී හඳුනාගත හැකිය.

ක්‍රිස්තුවර්ෂ 14-15 යන සියවසට අයත් සෙල්ලිපිවල බින්දු වර්ණය දැක්වීමේදී වර්තමානයේ බින්දුව ලියා දක්වන ආකාරයට අනුව අක්ෂරයට දකුණු පසින් බින්දුව සලකුණු කර ඇති අතර තව ද ඉස්පිල්ල යෙදෙන අක්ෂරයක් සමඟ බින්දුව යෙදෙන ඇතැම් අවස්ථාවන්හි අක්ෂරය සහ පිල්ලම අතර බින්දුව දක්වා ඇති අයුරු ද හඳුනාගත හැකි වේ.

භාෂා අධ්‍යයනයේදී සෙල්ලිපි තරමට ම වැදගත් නොවූවත් පුස්කොළ පොත් ඇසුරින් ද සෙල්ලිපි භාවිතය පිළිබඳ විශේෂතා හඳුනාගත හැකිය. අන්‍ය අක්ෂර මෙන් රූපීය වශයෙන් ප්‍රබල වෙනසකට

භාජනය නොවූ බින්දු වර්ණය සිංහල ලේඛන කලාවට පැමිණි මුල් කාලයේ සිට ම විශේෂිත ස්ථානීය වෙනසකම් ගණනාවකට ලක් වී ඇති බව සෙල්ලිපි මඟින් සිංහල බින්දු වර්ණයේ භාවිතය පිළිබඳ අධ්‍යයනය කිරීමේදී නිගමනය කළ හැකිය.

ආශ්‍රිත ග්‍රන්ථ

පඤ්ඤාසාර හිමි, ඔක්කම්පිටියේ (2005) **සිංහල අක්ෂර රූප විකාසය හා භාරතීය ආභාසය.** කර්තෘ ප්‍රකාශනයකි. ප්‍රථම මුද්‍රණය.

EPIGRAPHYA ZEYLANICA (1904-1912) Edited and translated Don Martino De Silva Wickremasnghe - vol 1, published for the Government of ceylon by Henry Frowde Oxforde University prees, London.

EPIGRAPHYA ZEYLANICA (1912-1927) Edited and translated Don Martino De Silva Wickremasnghe - vol 2, published for the Government of ceylon by Humphrey Miles Oxforde University prees, Amen House.

EPIGRAPHYA ZEYLANICA (1928-1933) Edited and translated Don Martino De Silva Wickremasnghe, H.W Codrington - vol 3, published by J.Jetley for Asian Education services,New Delhi.

EPIGRAPHYA ZEYLANICA (1933-1934) Edited and translated by H.W Codrington , s. paranavithana.- vol 4, published by J.Jetley for Asian Education services,New Delhi.

Godakumbura (1955) vol 5-part 1 printed at the Government press, Ceylon.

EPIGRAPHYA ZEYLANICA (1955) Edited by S. Paranavithana, C.E. Godakumbura - vol 5-part 2 printed at the Government press, Ceylon.

EPIGRAPHYA ZEYLANICA (1955) Edited by S. Paranavithana, C.E. Godakumbura - vol 5-part 3 printed at the Government press, Ceylon.